**UNIVERSITY OF PERADENIYA, SRI LANKA**

**දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

**පළමු වසර ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය (බාහිර - නව නිර්දේශය) - අගෝස්තු 2018**

**1ST YEAR (100 LEVEL) EXAMINATION IN BACHELOR OF ARTS (EXTERNAL - NEW SYLLABUS) AUGUST 2018**

**ග්‍රීක හා රෝම අධ්‍යයන**

**වීර කාව්‍යය හා නාට්‍යය කලාව – GRSE 101**

**මෙහි අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 5 කි.**

**ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

**කාලය - පැය තුනයි**

---

1. *එක්කෝ*

(i) හෝමර්ගේ ***ඔඩිසි*** වීරකාව්‍යයේ දැක්වෙන දේව මැදිහත්වීමේ තේමාව විමසන්න.

*නැතහොත්*

(ii) "පවුලට, සමාජයට සහ දෙවිවරුන්ට ඇති පක්ෂපාතීත්වය, පුරාණ ග්‍රීකයින්ගේ ජීවිතවල වැදගත් ලක්ෂණයකි." හෝමර්ගේ ***ඔඩිසි*** වීරකාව්‍යයේ පක්ෂපාතීත්වය පිළිබඳ තේමාව මෙම කියමන ඇසුරින් තක්සේරු කරන්න.

2. *එක්කෝ*

(a) හීසියඩ්ගේ ***තියෝර්ගනී*** කෘතිය ඇසුරින් කාන්තාවන් පිළිබඳව හීසියඩ්ගේ ආකල්පය සන්සන්දනාත්මකව විග්‍රහ කරන්න.

*නැතහොත්*

(b) හීසියඩ්ගේ වීරකාව්‍ය කලාවේ ප්‍රමුඛ ලක්ෂණ කවරේද? ඔබේ පිළිතුර ***වැඩපල සහ දින නිමිති*** කෘතිය ඇසුරින් උදාහරණ සහිතව තහවුරු කරන්න.

3. *එක්කෝ*

(a) "ඊඩිපස් සිය දෙනෙත් අන්ධකරගැනීම තුළින් ඔහුගේ මහත්වූ සීමා ඉක්මවීම සහ සිය වගකීම පිළිගැනීම පිළිබිඹු කරයි." සොෆොක්ලීස්ගේ ***ඊඩිපස් රජ*** නාට්‍යයේ ඊඩිපස් චරිතය පිළිබඳව දැක්වෙන මෙම නිරීක්ෂණය සමඟ ඔබ කෙතෙක් දුරට එකඟවන්නේද? හේතු දක්වන්න.

*නැතහොත්*

(b) ඇරිස්ටෝටල්ට අනුව සොෆොක්ලීස්ගේ ***ඊඩිපස් රජ*** නාට්‍යය, පරමාදර්ශී නාට්‍යයක් ලෙස සැලකීමට හේතු වූ ලක්ෂණ සාකච්ඡා කරන්න.

4. *එක්කෝ*

(a) මිනැන්ඩර්ගේ ***ද බැඩ් ටෙම්පර්ඩ් මෑන්*** නාට්‍යය ඇසුරින් ග්‍රීක නව ප්‍රහසන කාව්‍යය තුළ අඩංගු මූලික අංග ඇගයීමට ලක් කරන්න.

*නැතහොත්*

(b) මිනැන්ඩර්ගේ ***ද බැඩ් ටෙම්පර්ඩ් මෑන්*** නාට්‍යයේ සමාජය වරන්නාගේ චරිතය සාරාංශගතකොට එය එම නාට්‍යයේ හාස්‍ය රසය ජනනය කිරීමට ඇති වැදගත්කම විමර්ශනය කරන්න.

5. *එක්කෝ*

(a) ටෙරන්ස්ගේ ***ද මදර් ඉන් ලෝ*** නාට්‍යය ඇසුරින් නව රෝම ප්‍රහසන කාව්‍ය තුළ ඒකාකාරී චරිත භාවිතය පැහැදිලි කරන්න.

*නැතහොත්*

(b) ටෙරන්ස් ***ද මදර් ඉන් ලෝ*** නාට්‍යයේ භාවිතා කරන ප්‍රස්තාවනාව පිළිබඳව අදහස් දක්වන්න.

(5 x 20)